## වී වගාවට නුසුදුසු වගුරු බිම්වලින් ආදයම් ලබාගතහැකි මගක්–

# ගල්ලැහැ පන් වගාව

කෘෂිකම් උද්‍යාන විද්‍යා විෂය භාර නිළධාරි

**උපතිස්ස වීරකෝන්**

ඈත අතීතයේ සිටම ගොවි ගෙදරට නැතිවම බැරි මාගල්, පැදුරු, මළු, නිෂ්පාදනයට මෙන්ම අද සුවිසල් මැදුරුවල බිමට එළන විසිතුරු කළාලද, විසිතුරු තොප්පි, අත් බෑග්, ගමන් මළු නිපදවීමට ඉවහල් වන වගාවකි ගල්ලැහැ පන්.

**වගාකිරීමට සුදුසු පස:-**

නිතරම ජලයෙන් යටවී නොපවතින වරින් වර ජලයෙන් යටවන වගුරු සහිත පස් මේ වගාවට හිතකරය.

**වගා කිරීම:-**

හොඳින් වල් පැල මර්ධනය වන සේ පස සකස් කර (කුඹුරක් වැපිරීමට සකස් කරන ආකාරයට) ගත යුතුය. රෝපන ද්‍රව්‍ය සඳහා ගල්ලැහැ පන් රයිසෝම ලබාගත යුතුය. සිටුවීමට ගන්නා රයිසෝමවල නලාකාර පත්‍ර අඟල් 6 ක් වන සේ ඉතිරිකර කපා සකස්කර ගත යුතුයි. අක්කරයක් සිටුවීමට රයිසෝම 45000 ක් පමණ අවශ්‍ය වේ. රයිසෝමයක මිළ ශත 15 සිට 20 දක්වාවේ. සිටුවීමට පෙර අක්කරයකට එන්.පී.කේ 5:15:15 මිශ්‍රණයෙන් කිලෝ 50 ක් පමණ පසට යොද අඩි 1 × 1 පරතරයට සිටුවනු ලැබේ. සිටුවා සති 3 හෝ 4 දී පමණ අක්කරයකට ටී. ඩී. එම්. කිලෝ 35 ක් පමණ යෙදීම පන්වල නලාකාර පත්‍රවල වර්ධනයට සහ කෙඳි ශක්තිමත් වීමට ඉවහල් වේ.

**අස්වැන්න නෙළීම හා සකස් කිරීම:-**

නලාකාර පත්‍ර වැඩී මල් පිපී සති 2 දී පමණ අස්වැන්න නෙළීම සුදුසුය. මේ සඳහා මාස 3½ ක් පමණ ගතවේ. වගාවේ තත්වය අනුව අක්කරය-කින් අමු පන් කිලෝ 3000 සිට 5000 දක්වා ප්‍රමාණයක් ලබාගත හැක. පන් කැපිය යුත්තේ හොඳින් හිරුඑළිය ඇති අවස්ථාවකය. කැපූ පන් දින 3 ක් හෝ 4 ක් හොඳින් හිරු එළියේ දමා වේලා ගත යුතුය. වියළි බර 4 ට 1 කි. ප්‍රථම වගාවෙන් පසු වර්ෂ 7 ක් 8 ක් දක්වා හැම වර්ෂයකටම 3 න් වරක් පමණ අස්වැන්න නෙළිය හැකිය.

**වගා නඩත්තු:**

අස්වැන්න නෙලූ විගස වල් නෙලීම වැදගත් වන අතරම පොහොර යෙදීමද වැදගත්ය. සමහර වගාකරුවන් වල් මර්ධනය කිරීම සඳහා පන් අස්වැන්න නෙලූ විගසම වියළි පිදුරු හෝ කොළ අතු දමා ගිනි තබයි. මේ නිසා වල් මර්ධනයද රෝග හා කෘමි මර්ධනයද සිදුවන අතර පසට ලැබෙන අළු ප්‍රමාණය නිසා පොහොරද ලබාගත හැක.

**වගාවේ ප්‍රශ්න:**

රයිසෝමයට හා නලාකාර පත්‍රයට හානි කරන පුරුක් පණු වර්ගයක් නිසා පන් වගාවට හානි පැමිණේ. මේ සඳහා අක්කරයකට කාබෝෆියුරාන් කිලෝ 10 ක් පමණ යෙදීම කෘමි හානිය මර්ධනයට උපකාරී වේ.

තවද ගොයමට වැළඳෙන කොළපාළු රෝගය හා දුඹුරු පුල්ලි රෝගයද නලාකාර පත්‍රයට හානි කරයි. අවශ්‍යවුවහොත් ඒ සඳහා හිනෝසාන් වැනි දිලීර නාශකයක් යෙදීම ප්‍රයෝජනවත්ය.

**අක්කරයක් සඳහා යන වියදම:**

අක්කරයක් සිටුවීම සඳහා උදල්ලෙන් පස සකස් කර පොහොර යොද සිටුවීමට මිනිස් ශ්‍රම 40 ක් පමණ වැයවේ.

පන් මොරෙයියන් සඳහා රු. 6000 ක් පමණ වැයවේ. පොහොර සඳහා රු. 300 ක් පමණ වැය වේ. මේ අනුව අක්කරයක් වගා කිරීම සඳහා යන වියදම රු. 7500 ක් පමණ වේ.

**ආදයම:**

එක් වරකට නෙලන අස්වැන්නේ වටිනාකම රු. 3000 සිට 3500 ක් අතර මිළකට අලෙවි කළ හැක. එක් වර්ෂයක් තුළදී 3 න් වරක් පමණ අස්වැන්න නෙලන නිසා පළමු වර්ෂයේදීම රු. 8000/- ක පමණ ආදයමක් ලබාගත හැක. එක් වගාවකින් වර්ෂ 7 – 8 ක් පමණ අස්වැන්න නෙලා ගැනීමට හැකි නිසා මෙයින් ලබාගත හැකි ආදයමේ වටිනාකම කෙතෙක්දැයි ඔබට සිතාගත හැක.